මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ

ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පරිපාටියෙහි සංශෝධනය - 03

| ඡේද අංකය | දැනට තිබෙන පිළිවෙල | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනය කිරීමට හේතුව |
|---|---|---|---|---|
| 7.6 | ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුස්සන් තෝරා ගනු ලැබේ. ලිඛිත විභාගයේදී එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට පනහ (50% ) ක් හෝ සියයට පනහ ඉක්මවා ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් සියළුම විෂයන්ට ලැබූ ලකුණු වල මුළු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අනුපිළිවෙළට, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේදී හා ව්‍යුගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවාගනු ලැබේ.<br><br>ලිඛිත පරීක්ෂණයට - ලකුණු 100<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ලකුණු - ලකුණු 100 | 7.6 | ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුස්සන් තෝරා ගනු ලැබේ. ලිඛිත විභාගයේදී එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට හතලිහ (40% ) ක් හෝ සියයට හතලිහ ඉක්මවා ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් සියළුම විෂයන්ට ලැබූ ලකුණු වල මුළු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අනුපිළිවෙළට, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේදී හා ව්‍යුගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවාගනු ලැබේ.<br><br>ලිඛිත පරීක්ෂණයට - ලකුණු 100<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ලකුණු - ලකුණු 100 | රාජ්‍ය සේවයේ විභාග සඳහා සමත් ලකුණු සීමාව 40% වන බැවින් එය 40% සීමාව දක්වා අඩු කිරීම. |
| 7.6.4 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම 02 හි ඇතුලත් වේ. | 7.6.4 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ; ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම 02 හි ඇතුලත් වේ. | ලකුණු ලබාදීමේ ක්‍රමවේදය වෙනස් වීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022-04-21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 02

**<u>ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරීතනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.</u>**

01. විභාගයේ නම : ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

02. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

03. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු ඇති වන අවස්ථාවන්හිදී පවත්වනු ලැබේ.

04. ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර:

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය<br>සමාජ සේවා නිලධාරි 1 ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය ඉක්මවූ පසු වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 50 | 50 | 50 | ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවාගනු ලැබේ. |
| 2. වෘත්තීය/ක්ෂේත්‍රයට අදාළ වන පාඨමාලා හදාරා තිබීම.<br>I. තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ වැඩ/ මානව විද්‍යාව/ අපරාධ විද්‍යාව/ නීතිය/ සාමය හා ගැටුම් කළමනාකරණය/ උපදේශනය යන විෂයයන්ට අදාළව ලබාගත් | | 15 | 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25 අ වන වගන්තිය මඟින් නියම කර ඇති විධිවිධාන ප්‍රකාරව උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා හට උසස් අධ්‍යාප ආයතන උපාධි පිරිනැමීමේ ආයතන වශයෙන් පිළිගැනීම සඳහා බලය පැවරී ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HE/NS/09/215 හා 2021.09.29 දිනැති ලිපිය මඟින් දන්වා ඇති බැවින් ඒ අනුව සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝදනය කරන ලෙස මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ CPC/CS/2/7/SOR/G5 /2021 හා 2021.10.14 දිනැති ලිපිය මඟින් දැනුම් දීම. |
| 1. පශ්චාත් උපාධියක් සඳහා | 07 | | |
| 2. ඩිප්ලෝමාවක් සඳහා | 03 | | |
| 3. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා(මාස 06 කට නොඅඩු) | 02 | | |
| ගරු ආණ්ඩුකාරතුමා විසින්<br>2022 - 04 - 21 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | | | |
| II. විෂයානුබද්ධව ලබා ඇති විශේෂ පුහුණුවීම් හා පාඨමාලා(එක් පාඨමාලාවක් සඳහා 1 ලකුණ බැගින්) | 03 | | |
| 3. නිර්මාණාත්මක වැඩසටහන් සඳහා<br>I. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන වලට පරිභාහිරව සිදු කරනු ලැබූ වැඩසටහන්/විෂය පරිබාහිරව සිදු කරනු ලැබූ විශේෂ සමීක්ෂණ වලට සහභාගී වීම. | 05 | 05 | |

| | | | |
|---|---|---|---|
| 4. කාර්ය සාධනය ( ආසන්නතම වර්ෂ 05 සඳහා)<br>(එක් වර්ෂයක් සඳහා ලකුණු)<br><br>විශිෂ්ඨයි<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ බව<br>සතුටුදායකයි | <br><br><br>05<br>04<br>02 | 25 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | 05 | |
| එකතුව | | 100 | |

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..............................

02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..............................

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

04. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................

05. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

06. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................

07. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..............................

දිනය 2022.03.22

ආණ්ඩුකාර ලේකම්,

2022.03.22 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2022/381 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි සංශෝධනය - 03 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2022.04.06

..............................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාව
නිල මුද්‍රාව.

ටී.ඒ.ඩී.ඩබ්ලිව්. ධයානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/ප්‍රතික්ෂේප කරමි

..............................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා

දිනය 2022-04-21

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත